# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1859/66 - 2014 අප්‍රේල් මස 25 වැනි සිකුරාදා - 2014.04.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ බස්නාහිර පළාතේ පළාත් සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම පිණිස මෙහි පහත උපලේඛනයේ I තීරුවෙහි නම් සඳහන් බස්නාහිර පළාතේ VI වැනි පළාත් සභාවේ මන්ත්‍රීවරුන්, II තීරුවෙහි සඳහන් අමාත්‍යාංශයන්හි අමාත්‍යවරුන් වශයෙන් 2014.04.04 වැනි දින පත් කළ බව මෙයින් නිවේදනය කරමි.

**උපලේඛනය**

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *නම* | *පත්කරන ලද ධූරය /අමාත්‍යාංශය* |
| ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා | බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවර ලෙස |
| ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා | බස්නාහිර පළාතේ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යවරයා ලෙස |
| ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමා | බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයා ලෙස |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *නම* | *පත්කරන ලද ධුරය /අමාත්‍යාංශය* |
| ගරු රංජිත් සෝමවංශ කාලවිල විතානගේ මැතිතුමා | බස්නාහිර පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යවරයා ලෙස |
| ගරු හේවාමාතරගේ උපාලි කොඩිකාර මැතිතුමා | බස්නාහිර පළාතේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජල සම්පාදන හා ජලාපවහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යවරයා ලෙස |
| ගරු ඇන්ටනී නිමල් ලාන්සා වර්ණකුලසූරිය මැතිතුමා | බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදාහැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යවරයා ලෙස |

තවද, ඉහත කී එක් එක් අමාත්‍යාංශ යටතට පහත සඳහන් පරිදි බස්නාහිර පළාතේ පළාත් සභාවේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන/අධිකාරී ක්‍රියාත්මක විය යුතු බවට ද මෙයින් වැඩිදුරටත් නිවේදනය කරමි.

**මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය සහ සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය**

1. බස්නාහිර පළාතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
2. බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව
3. බස්නාහිර පළාතේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
4. බස්නාහිර පළාතේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
5. බස්නාහිර පළාතේ පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
6. බස්නාහිර පළාතේ පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනය
7. බස්නාහිර පළාතේ පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය
8. බස්නාහිර පළාතේ පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය
9. වෙස්ප්‍රෝ ප්‍රින්ටර්ස් (බස්නාහිර පළාතේ පළාත් මුද්‍රණාලය)

**කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**

1. බස්නාහිර පළාතේ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
2. බස්නාහිර පළාතේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
3. බස්නාහිර පළාතේ පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව
4. බස්නාහිර පළාතේ පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
5. බස්නාහිර පළාතේ පළාත් කෘෂි සේවා අධිකාරිය
6. බස්නාහිර පළාතේ පළාත් සෞන්දර්යය නිකේතන පාලන අධිකාරිය
7. බස්නාහිර පළාතේ පළාත් කලාකෙත
8. ජනාධිපති ශිල්ප කලා ශාලිකා - ගම්පහ

**සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශය**

1. බස්නාහිර පළාතේ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
2. බස්නාහිර පළාතේ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
3. බස්නාහිර පළාතේ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

**විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජල සම්පාදන හා ජලාපවහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය**

1. බස්නාහිර පළාතේ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව
2. බස්නාහිර පළාතේ පළාත් නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව
3. බස්නාහිර පළාතේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

**ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදාහැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශය**

1. බස්නාහිර පළාතේ පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
2. බස්නාහිර පළාතේ පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව
3. බස්නාහිර පළාතේ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
4. බස්නාහිර පළාතේ පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
5. බස්නාහිර පළාතේ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
6. බස්නාහිර පළාතේ පළාත් සංචාරක මණ්ඩලය
7. පොල්වත්ත ක්‍රීඩා පාසල
8. සිරිමාවෝ බණ්ඩාරණායක ක්‍රීඩා සංකීර්ණය - ගම්පහ

එස්. අලවි මව්ලානා,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර.

වර්ෂ දෙදහස් දාහතරක් වූ අප්‍රේල් මස 08 වැනි දින,
කොළඹ 05,
98/4 හැව්ලොක් පාර,
බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

05 - 334/1

---

## බස්නාහිර පළාතේ පළාත් සභාව

### බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වගන්තිය යටතේ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරවර සෙයිඩ් අලවි මව්ලානා මැතිතුමා විසින් පහත සඳහන් පත් කිරීම් අනුමත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

| *අනු අංකය* | *නම/සේවය/පන්තිය/ශ්‍රේණිය* | *පත්කරන ලද තනතුර /අමාත්‍යාංශය හා ක්‍රියාත්මක වන දිනය* |
|---|---|---|
| 01 | ජේ. එම්.සී. ජයන්ති විජේතුංග මහත්මිය<br>ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණිය | 2014.04.04 වැනි දින සිට බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ විෂය පථයට අයත් වන මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පරිපාලන හා ඉංජිනේරු සේවා යන විෂයයන්ට අදාලව ලේකම් වශයෙන් |
| 02 | එස්. ටී. කොඩිකාර මහතා,<br>ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණිය | 2014.04.04 වැනි දින සිට බස්නාහිර පළාතේ ඉඩම්, හා අධ්‍යාපන, පළාත් පාලන, මිනිස් බල හා රැකීරක්ෂා සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් |
| 03 | එන්. නීල්වල මහතා,<br>ශ්‍රී.ලං.ප.සේ. 1 පන්තිය | 2014.04.04 වැනි දින සිට බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ වැඩබලන ලේකම් වශයෙන් |

| *අනු. අංකය* | *නම/සේවය/පන්තිය/ශ්‍රේණිය* | *පත්කරන ලද තනතුර /අමාත්‍යාංශය හා ක්‍රියාත්මක වන දිනය* |
|---|---|---|
| 04 | එම්. සී. එල්. රොද්‍රිගෝ මහතා,<br>ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණිය | 2014.04.04 වැනි දින සිට බස්නාහිර පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් |
| 05 | ප්‍රදීප් රත්නායක මහතා,<br>ශ්‍රී.ලං.ප.සේ. 1 පන්තිය | 2014.04.04 වැනි දින සිට බස්නාහිර පළාතේ විදුලි බල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජල සම්පාදන හා ජලාපවහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැඩබලන ලේකම් වශයෙන් |
| 06 | එස්. ජී. විජයබන්දු මහතා,<br>ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණිය | 2014.04.04 වැනි දින සිට බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදාහැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් |

සුනිල් අබේවර්ධන,
බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්.

වර්ෂ දෙදහස් දාහතරක් වූ අප්‍රේල් මස 08 වැනි දින,
කොළඹ 05,
98/4 හැව්ලොක් පාර,
බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

05 - 334/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.